| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 6 ශ්‍රේණිය | **බුද්ධ ධර්මය** |

නම/ විභාග අංකයඃ ...................................... කාලය පැය 2 යි

**i කොටස**

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබුවේ,
  i. ඇසළ පොහෝ දින  ii. වෙසක් පොහෝ දින
  iii. පොසොන් පොහෝ දින  iv. බක් පොහෝ දින

(2) දියුණුව සඳහා උපකාරි වන කරුණු ඇතුලත් ජාතක කතාව වන්නේ
  i. මඝමානවක ජාතකය  ii. සාමජාතකය
  iii. අත්ථස්සද්වාර ජාතකය  iv. වන්නුපථ ජාතකය

(3) තමා උපමා කොටගෙන වරදින් වැළකීම හැඳින්වෙන්නේ
  i. අත්තූපනායික ධර්මය ලෙසය  ii. පන්සිල් ලෙසය
  iii. දස සීලය ලෙසය  iv. ආජීව අෂ්ටමක ශීලය ලෙසය

(4) ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ සම්මා වාචාවට අයත් නොවන්නේ
  i. බොරු නොකීම  ii. කේලාම් නොකීම
  iii. පරුෂවචන නොකීම  iv. සොරකම් නොකිරීම

(5) දෙමව්පියන් බ්‍රහ්ම යන නාමයෙන් හඳුන්වන්නේ
  i. පන්සිල් ආරක්ෂා කරන බැවිනි
  ii. දරුවෙන්ට නිවැරදි මග කියාදෙන බැවිනි
  iii. සතර බ්‍රහ්ම විහරණවලින් යුක්ත වන නිසාය
  iv. දරුවන්ට යුතුකම් ඉටුකරන  බැවිනි

(6) දෙමව්පියන්ට යුතුකම් ඉටුකළ යුතු බව දැක්වෙන සූත්‍ර දේශනාව වන්නේ
  i. කරණීය මෙත්ත සූත්‍රය  ii. රතන සූත්‍රය
  iii. සිඟාලෝවාද සූත්‍රය  iv. මහා මංගල සූත්‍රය

(7) උදෑසන අව්දි වී වැලිදෝතක් උඩ දමා මේ තරමටමට ගුරුවරුන්ගේ අවවාද ලැබේවා යන ප්‍රාර්ථනාව සිදුකරන ලද්දේ
  i. රාහුල හිමියන්ය  ii. සුනීත හිමියන්ය
  iii. සෝපාක හිමියන්ය  iv. ආනන්ද හිමියන්ය

(8) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාවට අයත් නොවන්නේ

i. සම්මා වාචා | ii. සම්මා වායාම
iii. සම්මා කම්මන්ත | iv. සම්මා ආජීව

(9) 'විසි වසරකට පෙර රූ රැජින තරඟයෙන් ජයගත් මාලා දැන් වියපත් වෙලා හිසකෙස් සුදුවෙලා, හම රැලිවැටිලා' මෙම වෙනස් වීම ධර්මයේ හැඳින්වෙන්නේ

i. අනිත්‍ය ලෙසිනි | ii. දුක්ඛ ලෙසිනි
iii. අනාත්ම ලෙසිනි | iv. සමානාත්මතාව ලෙසිනි

(10) සියලු ජාතීන් අතර එකමුතුකම ජාතික කොඩියෙන් නිරූපනණය වන්නේ

i. තද රතුපාට මගිනි | ii. කහ තීරුව මගිනි
iii. අසිපත මගිනි | iv. බෝපත් මගිනි

- නිවැරදි පිළිතුර තෝරා යාකරන්න

| | |
|---|---|
| (11) රාහුල කුමරු උපත ලැබුවේ | මහමායා දේවිය |
| (12) සිදුහත් කුමරුගේ ගුරුවරයා | වෙසක් පොහෝ දින |
| (13) සිදුහත් කුමරුගේ මව | ඇසළ පොහෝ දින |
| (14) පෙර ආත්මභවයක් සිහිකරන නුවණ | සර්වමිත්‍ර බමුණා |
| (15) සිදුහත් කුමරු උපත ලැබුවේ | පුබ්බේනිවාසානුස්සති ඥාණය |

- නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(16) සිල්වත්ව කටයුතු කිරීමේ ආනිසංස ගණන ………………… කි.

(17) මගධයේ රජගහනුවර …………………………… නම් ගමේ මඝ මානවක කුමරු ජීවත් විය.

(18) බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය ……………………….. ගෘහපතියාට දේශනා කළ සේක.

(19) නිබ්බුත පද ගායනා කළේ ……………………………………..යි.

(20) නොකළ යුත්ත නොකිරීම ……………………………………… ලෙස හැඳින්වේ.

(මචල, සිඟාල, කිසාගෝතමිය, පහ, හය, විරමනය.)

## 11 කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.

(1) දෙවැනි වාරයට නියමිත ''නිදහස් කවි නිර්මාණ'' යන මාතෘකාව යටතේ කළ ඇගයීම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. කවි නිර්මාණය සඳහා ඔබ යොදාගත් පාඩමේ මාතෘකාව ලියන්න.
ii. ඇගයීම සිදුකිරීමට පෙර ගුරුතුමා විසින් ඔබට ලබාදුන් උපදෙස් 02 ක් ලියන්න.
iii. අපේ ලොවේ හිරු සඳු ලෙස සැලකෙන්නේ කවුරුන්ද?
iv. සිව්බඹ විහරණ අතරින් 02 ක් ලියන්න.
v. දෙමාපියන් උපමාකොට ඇති දිශාව කුමක් ද?
vi. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන්ගෙන් දරුවන්ට ඉටුවිය යුතු යුතුකම් අතරින් 04ක් ලියන්න.
vii සිඟාලෝවාද සූත්‍රයට අනුව දරුවන්ගෙන් දෙමාපියන්ට ඉටුවිය යුතු යුතුකම් අතරින් 04ක් ලියන්න.
viii දරුවන් ලෙස ඔබට දෙමාපියන්ගේ සිත් සතුටු කිරීමට කළහැකි දේවල් 02 ක් ලියන්න.

(ල. 20)

(2)

i. අත්ථස්සද්වාර යන්නෙහි තේරුම කුමක්ද?
ii. කම්මැලිකම දියුණුවට බාධාවක් වන බවට කරුණු 03ක් ලියන්න.
iii. දියුණුවේ දොරටු හය අතරින් 5 ක් ලියන්න.

(3)

i. සසර දුකින් අත්මිදීමට උපකාර වන මාර්ගය කුමක්ද?
ii. ශීල ශික්ෂාවට අයත් අංග 03 ලියන්න.
iii. සිල්වත්ව කටයුතු කිරීමේ ආනිසංස පහ ලියන්න.

(4)

i. ගිහියාගේ නිත්‍ය ශිලය කුමක්ද?
ii. පන්සිල් පද අතරින් තුනක් ලියන්න.
iii. විරමනය හා සමාදානය එක් සිල්පදයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(5)

i. පන්සිල් සුරැකීමේ හා සැමට මෛත්‍රී කිරීමේ අගය පෙන්වාදෙන ජාතක කථාව කුමක්ද?

ii. ශිෂ්‍යයන් ලෙස එකමුතුව වැඩ කිරීමේ අගය පිළිබඳ වාක්‍ය තුනක් ලියන්න.

iii. මඝ මානවක ආරක්ෂා කළ ප්‍රතිපත්ති හතෙන් පහක් ලියන්න.

(6)

i. කිසියම් ක්‍රියාවක හොඳ නරක හඳුනාගන්නා ආකාරය ඇතුළත්වන සූත්‍ර දේශනාව කුමක්ද?

ii. එම සූත්‍රයට අනුව හොඳ ක්‍රියාවක් හඳුනාගන්නා මිනුම් දඬු තුන ලියන්න.

iii. ඔබට කළහැකි යහපත් ක්‍රියා 5ක්  ලියන්න.